# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2430/33 – 2025 අප්‍රේල් මස 04 වැනි සිකුරාදා – 2025.04.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2019/328

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන)**
**කාර්මික ආරාවුල් පනත**
4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධි විධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.22 වන දින අංක 2320/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.02.17 වැනි දින දරන නියෝගයෙන්,

ඩබ්. ඒ. ඩී. පී. පෙරේරා මයා,
ඊ/5,
දියවන්නා උද්‍යානය,
දකුණු තලංගම,
බත්තරමුල්ල.

*සහ*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
අංක 14,
ගාලු පාර,
රත්මලාන.

අතර පවත්නා 2023.01.31 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මහතා වෙත යොමු කරන ලදි.

බේරුම්කරු නීතිඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මහතා එම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.02.17 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0028/1

---

මගේ අංකය : IR/COM/04/2019/328

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

ඩබ්. ඒ. ඩී. පී. පෙරේරා මයා,
ටී/5,
දියවන්නා උද්‍යානය,
දකුණු තලංගම,
බත්තරමුල්ල.

*සහ*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
අංක 14,
ගාලු පාර,
රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, කොස්වත්ත, රිවඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/04/2019/328

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය).**

ඩබ්. ඒ. ඩී. පී. පෙරේරා මයා,
ටී/5,
දියවන්නා උද්‍යානය,
දකුණු තලංගම,
බත්තරමුල්ල.

*සහ*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
අංක 14,
ගාලු පාර,
රත්මලාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ

"ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රියදුරෙකු වශයෙන් සේවය කරන ඩබ්. ඒ. ඩී. පී. පෙරේරා මහතාට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණය පවත්වා අවසන් වීමට පෙර දඬුවමක් වශයෙන් ඔහුව ස්ථාන මාරුකිරීම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්.කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 මාර්තු මස 12 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 - 0028/2

---

මගේ අංකය : IR/COM/01/2024/37

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

මලිඳු සඳරුවන් ජයසූරිය මයා,
අංක 365,
කොහොල්විල පාර,
කැළණිය.

*සහ*

තම්බපණ්ණි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්,
යද්දෙහිමුල්ල පාර,
උණවටුන,
ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, නො. 242, නීතිඥ ඕබඩගේ ලීලාරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/01/2024/37

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

මලිඳු සඳරුවන් ජයසූරිය මයා,
අංක 365,
කොහොල්විල පාර,
කැළණිය.

*සහ*

තම්බපණ්ණි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්,
යද්දෙහිමුල්ල පාර,
උණවටුන,
ගාල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුනු වනුයේ

"තම්බපණ්ණි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන සූපවේදී වශයෙන් සේවය කළ මලිඳු සඳරුවන් ජයසූරිය යන අය හට 2022 මාර්තු සිට 2022 සැප්තැම්බර් මස දක්වා ඔහුගේ පත්වීම් ලිපියේ එකඟ වූ සම්පූර්ණ වැටුප නොගෙවා දීමනා ආදිය ඉවත්කර අඩු වැටුපක් ගෙවීම මගින් ඔහුට යම් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්.කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 මාර්තු මස 21 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 - 0029

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.